# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2118/42 - 2019 අප්‍රේල් මස 09 වැනි අඟහරුවාදා - 2019.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය

දකුණු පළාතේ පළාත් සභාව විසින් 2019 මාර්තු මස 26 වැනි දින අනුමත කරන ලදුව දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2019 අප්‍රේල් මස 01 වැනි දින අනුමත කළ දකුණු පළාතේ 2019 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ආණ්ඩුකාර අනුමැතිය ලද 2019 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන බව දකුණු පළාතේ පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන පිළිබඳ අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම මෙයින් දැනුම් දෙමි.

**උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,**
දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග,
ජලසම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්,
වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

2019 අප්‍රේල් මස 01 වැනි දින,
4 මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල
දකුණු පළාතේ පළාත් සභා කෘෂිකර්ම අමාත්‍ය කාර්යාලයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය

දකුණු පළාතේ සමුපකාර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් එම යෝජනා ක්‍රමය දකුණු පළාතේ මෙහෙයවනු ලැබීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. 2019 අංක 02 දරන දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන මෙය දකුණු පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

### 1 වන කොටස

#### සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම

සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම.

2. (i) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයක් පිහිටුවනු ලැබිය යුතු ය.

නීතිගත සංස්ථාවක් විය යුතු බව

(ii) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එහි නෛතික සංස්ථාගත තත්ත්වයෙන් නඩු හෝ නීති කෘත්‍ය ඉදිරිපත් කිරීමට සහ නඩු සහ වෙනත් නීති කෘත්‍ය සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද, මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය සියලු දේ කිරීමට ද බලය ඇති නීතිගත සංස්ථාවක් බවට පත්වන්නේ ය.

අධ්‍යක්ෂකවරයා පත් කිරීම

3. (i) සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පරිපාලනය කිරීමේ කාර්යය සඳහා තත්කාලයේ දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් ධුරය දරන තැනැත්තා යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂකවරයා වන්නේ ය.

අධ්‍යක්ෂකවරයාගේ කාර්ය භාරය

(ii) අධ්‍යක්ෂවරයා යෝජනා ක්‍රමයේ කටයුතු සහ කාර්යය අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සම්බන්ධව වගකිව යුතු ය.

උපදේශක කාරක සභාව

(iii) යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ සියලු කටයුතු පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සම්බන්ධව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීමේ හා නිර්දේශ ලබාදීමේ කාර්යය සඳහා මතු සඳහන් පරිදි හත් දෙනෙකුගෙන් සමන්විත උපදේශක කාරක සභාවක් සිටිය යුතු ය. එම සාමාජිකයන් අතුරින් 3(iv) වගන්තියේ (ඊ) සහ (එ) යන වගන්ති යටතේ දැක්වෙන සාමාජිකයින් අමාත්‍යවරයා විසින් ද (ඉ) යන වගන්තියේ දැක්වෙන සාමාජිකයා සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ද පත්කරනු ලැබිය යුතු ය.

උපදේශක කාරක සභාවේ සංයුතිය

(iv) උපදේශක කාරක සභාවේ සාමාජිකයින් වශයෙන්,

(අ) දකුණු පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්;
(ආ) දකුණු පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්);
(ඇ) කම්කරු කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙක්;
(ඈ) දකුණු පළාතේ පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්;
(ඉ) දකුණු පළාතේ ගාල්ල/මාතර/හම්බන්තොට සමුපකාර ග්‍රාමීය බැංකු සංගම් නියෝජනය කරමින් එක් අධ්‍යක්ෂකවරයෙක් හෝ සාමාන්‍යාධිකාරීවරයෙක්;
(ඊ) වසර 05කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති, නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ දකුණු පළාතේ සමුපකාර සමිතියක හෝ සංගමයක සභාපතිවරයෙක්;
(එ) අවුරුදු 20 කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති සේවයේ නියුතු හෝ විශ්‍රාමික හෝ නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ දකුණු පළාතේ, සමුපකාර සමිතියක හෝ සංගමයක සේවකයෙක්,

පත්කරනු ලැබිය යුතු ය.

(v) උපදේශක මණ්ඩලයේ තීරණය පරිදි දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් පමණක් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය යොදවාගත හැකිය. කාර්ය මණ්ඩලය.

04. (i) (අ) මෙම ප්‍රඥප්තියේ 3(iv) වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඉ) යන වගන්තිවල සඳහන් උපදේශක කාරක සභිකයන්ගේ ධුර කාලය එම නිල තනතුරු දරන කාලයට සීමා වන්නේ ය.

(ආ) මෙම ප්‍රඥප්තියේ 3 (iv) වගන්තියේ (ඇ) වගන්තිය යටතේ පනවන උපදේශක කාරක සභික සාමාජිකයා කම්කරු කොමසාරිස් ජනරාල්වරයාම වන විටදී එම අයගේ ධුර කාලය නිල තනතුරු දරන කාලයට සීමා වන්නේය. කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලබන්නේ නම් ඔහුගේ ධුර කාලය මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ධුරය හිස් වුවහොත් මිස අවුරුදු 03 ක කාල පරිච්ඡේදයක් සඳහා විය යුතු ය. එසේ වුවද කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් වෙනත් නිලධාරියෙකු නම් කිරීමෙන් මුලින් පත්කළ නිලධාරියාගේ පත්වීම අහෝසි වන්නේ ය. උපදේශක කාරක සභාවේ සාමාජිකයන්ගේ සුදුසුකම් හා ධුර කාලය.

(ඇ) මෙම ප්‍රඥප්තියේ 3(iv) වගන්තියේ (ඊ), (උ) වගන්ති යටතේ උපදේශක කාරක සභාවට පත්කරනු ලබන සාමාජිකයෙකුගේ මිය යාමෙන් හෝ කවර හෝ අවස්ථාවකදී අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස්වුවහොත් මිස අවුරුදු 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(ii) උපදේශක කාරක සභාවට මෙම ප්‍රඥප්තියේ 3 (iv) වගන්තියේ (ඊ) සහ (උ) වගන්ති යටතේ පත්කළ සාමාජිකයෙකු ඉහත දක්වෙන පරිදි ධුරය හිස් කරන ලද අවස්ථාවක 03 (iii) උපවගන්තියේ විධිවිධාන ගැන සැලකිලිමත්ව ඔහු වෙනුවට වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු අතර, ඒ සාමාජිකයා තමා පත් කරනු ලැබීමට හේතු වූ අනුප්‍රාප්තිකයාගේ ඉතිරිව ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(iii) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ උපදේශක කාරක සභාවට පත්කළ සාමාජිකයෙකුට තම කාර්යයන් ඉටු කිරීමට නොහැකි බව අනාවරණය වුවහොත් ඔහු වෙනුවට වැඩ ආවරණය කරනු ලබන තැනැත්තා වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය.

(iv) ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයෙකු හැර, ධුරය හිස් කරන උපදේශක කාරක සභාවේ යම් සාමාජිකයෙකු නැවත පත්කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

(v) උපදේශක කාරක සභාවට මෙම ප්‍රඥප්තියේ 3(iv) වගන්තියේ (ඉ) වගන්තිය යටතේ පත්කළ සාමාජිකයෙකු අඛණ්ඩව උපදේශක කාරක සභා රැස්වීම් වාර තුනකට සහභාගි නොවුවහොත්, සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ඔහු වෙනුවට එම වගන්තිය යටතේ වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු අතර, ඒ සාමාජිකයා තමා පත්කරනු ලැබීමට හේතු වූ අනුප්‍රාප්තිකයාගේ ඉතිරිව ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(vi) උපදේශක කාරක සභාවට මෙම ප්‍රඥප්තියේ 3(iv) වගන්තියේ (ඊ) සහ (උ) වගන්ති යටතේ පත්කළ සාමාජිකයෙකු අඛණ්ඩව උපදේශක කාරක සභා රැස්වීම් වාර තුනකට සහභාගි නොවුවහොත්, උපදේශක කාරක සභාව විසින් ඒ බව අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු වන්නේ ය.

05. උපදේශක කාරක සභාව විසින් පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය: උපදේශක කාරක සභාවේ කාර්යයන්.

(i) මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම,

(ii) මෙම යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීමට, මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳව අධ්‍යක්ෂකවරයාට උපදෙස් දීම,

(iii) මෙම යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු සමාලෝචනය කිරීම.

06. (i) සමුපකාර විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා උපදේශක කාරක සභාවේ සභාපති වන්නේය. ඔහු සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. උපදේශක කාරක සභාවේ රැස්වීම්.

(ii) අධ්‍යක්ෂකවරයා උපදේශක කාරක සභාවේ ලේකම් වේ. ඔහු විසින් උපදේශක කාරක සභාවේ රැස්වීම් කැඳවිය යුතු අතර, එම රැස්වීම මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි අන්දමින් පවත්වනු ලැබිය යුතු ය.

පුරප්පාඩුව/පුරප්පාඩු

(iii) උපදේශක කාරක සභාවේ පුරප්පාඩුවක්/ පුරප්පාඩු පවතින අවස්ථාවකදී එකී උපදේශක කාරක සභාව විසින් ගනු ලබන තීරණ කිසිවක් එකී පුරප්පාඩුව හේතුවෙන් අවලංගු නොවේ.

සනපූර්ණය

(iv) උපදේශක කාරක සභාවේ රැස්වීමක සනපූර්ණය සාමාජිකයන් හතරදෙනෙකු විය යුතු ය.

උපදේශක කාරක සභාවේ පාරිශ්‍රමිකය

07. උපදේශක කාරක සභාවේ රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් උපදේශක කාරක සභාවේ සාමාජිකයන්ට දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකිය.

## *2 වන කොටස*

### *සමුපකාර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම*

යෝජනා ක්‍රමයට බැඳීමට සුදුසුකම්.

08. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දිනට පෙර සේවයට බැඳී, මේ දක්වා සේවයේ යෙදී සිටින වයසින් අවුරුදු 18ට අඩු නොවූ සහ වයස 60 දක්වා වූ ස්ථිර පත්වීමක් ලද සමුපකාර සේවකයෙකුට මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇත.

යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන්ම දයක වියයුතු බව.

09. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට ස්ථිර සේවයට බැඳෙන සමුපකාර සමිති සේවකයන් මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනිවාර්යෙන් දයක විය යුතු ය.

යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ.

10. (i) මෙම යෝජනා ක්‍රමයට බැඳෙන්නා වූ (මෙහි මින් මතු දායක යනුවෙන් සඳහන් කරනු ලබන) සමුපකාර සමිති සේවකයෙකු නියෝග මගින් නියම කරනු ලබන පදනමක් මත මේ යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබිය යුතු ය:

(*අ*) නියම කරනු ලැබිය හැකි පරිදි කාල පරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක්,

(*ආ*) නියම කරනු ලැබිය හැකි පරිදි කාල පරිච්ඡේද අනුව මින්මතු පාරිතෝෂික නමින් දැක්වෙන මරණ පාරිතෝෂිකයක්.

(ii) දයකත්වයේ කාලසීමාව, දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද දයක මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප හෝ මරණ පාරිතෝෂිකය හෝ ගෙවීමේ පදනම නියම කරනු ලැබිය යුතු ය.

විශ්‍රාම වැටුප ගෙවිය යුතු අවස්ථා.

11. (i) දායකයා තම වයස අවුරුදු 60 වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය. එසේ වුවද තම දයක මුදල් ගෙවීම ආරම්භ කළ දායකයෙකු නියම කරනු ලබන ඔහුගේ මුළු දායක මුදල් ප්‍රමාණය ගෙවා සම්පූර්ණ වුව ද විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලබනුයේ යෝජනා ක්‍රමය අනුමත වී අවුරුදු 01ක් ඉකුත් වීමෙන් පසුවය.

(ii) දායකයා මාසයේ කුමන දිනයක මියගිය ද එම මාසයේ අවසානය දක්වා විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතු ය.

මරණ පාරිතෝෂිකය

12. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර දිනයක දායකයා මියගිය විටෙක නියෝගවලින් නියම කරන පදනම මත ජීවත්ව සිටින යැපෙන්නන් හට නියම කරනු ලබන මරණ පාරිතෝෂික ගෙවිය යුතු ය.

විශ්‍රාම වැටුපට හිමිකම් නොලැබීම.

13. (i) තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර දායකයෙකු තම සේවා යෝජකයා වූ සමුපකාර සමිතියට හෝ සංගමයට මූල්‍ය අලාභයක් හෝ හානියක් සිදුකොට ඇති බව නීත්‍යානුකූල පරීක්ෂණයකින් සනාථ වී තිබේ නම් මේ ප්‍රඥප්තිය යටතේ කිසිදු ප්‍රතිලාභ හිමිකමකට , විශ්‍රාම වැටුපකට හිමිකම් නොලැබිය යුතුය. එසේ වුව ද සමිතියට හෝ සංගමයට සිදුකළ මූල්‍ය අලාභය හෝ හානිය ප්‍රතිපූර්ණය කොට යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට, නියම කරනු ලබන නියෝග අනුව හා 14 වන වගන්තියේ විධිවිධාන අනුව දයකයාට හිමිකම් තිබිය යුතු ය.

(ii) (*අ*) යම් දායකයෙකු සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී සිය සේවා යෝජකයා වූ සමුපකාර සමිතියට හෝ සංගමයට මූල්‍ය අලාභයක් හෝ හානියක් සිදුකොට ඔහුට එරෙහිව නීත්‍යානුකූල පරීක්ෂණයක් අවසන් වන තුරු ප්‍රඥප්තිය යටතේ ඒ දායකයාට ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් තාවකාලිකව නතර කිරීමේ බලය අධ්‍යක්ෂවරයාට ඇත්තේය.

(ආ) 13 (ii) (අ) යටතේ දායකයාට එරෙහිව පැවැත්වෙන නීත්‍යානුකූල පරීක්ෂණයක් මාස 03 කට වඩා ප්‍රමාද වුවහොත් උපදේශක කාරක සභාවේ අනුමැතිය ඇතිව විශ්‍රාම වැටුපෙන් අඩක් හෝ ඊට අඩු ප්‍රමාණයක් පරීක්ෂණයට කිසිදු අගතියක් නොවන පරිදි දායකයාට ගෙවිය හැකිය.

(ඇ) ඉහත කී දායකයා වෙනුවෙන් කරනු ලබන නීත්‍යානුකූල පරීක්ෂණයේ දී දායකයා නිදහස් වුවහොත් විශ්‍රාම ගත් දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ද ලැබීමට දායකයාට හිමිකම් ලැබිය යුතු ය.

එක් එක් දායකයා වෙත අධ්‍යක්ෂවරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු බව.

14. (i) යම් සමුපකාර සේවකයෙකු යෝජනා ක්‍රමයේ දායකයෙකු ලෙස බඳවා ගනු ලැබූ විට අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර එහි දායකයා විසින්,

(අ) ගෙවනු ලැබිය යුතු දායක මුදල ;
(ආ) සමුපකාර සමිතියේ හෝ සංගමය විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් ;
(ඇ) සහතිකයේ නියමයන් හා කොන්දේසි ;
(ඈ) දායකයා වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ දායකයාට හිමිවන ප්‍රතිලාභ ;

සඳහන් කළ යුතු ය.

(ii) දායකයෙකු විසින් වරින්වර හෝ අඛණ්ඩව කිසියම් දිනකට වාරික තුනකින් දායක මුදල් ගෙවීම පැහැරහැර ඇති විටක ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමිවිය යුතු ය.

(iii) යම් දායකයෙකු වෙත නිකුත් කර ඇති සහතිකය යටතේ ප්‍රතිලාභ යම් දායකයෙකුට අහිමි වීමට ඇති අවස්ථාවක ඒ බවට දැන්වීමක් අධ්‍යක්ෂවරයා විසින් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(iv) තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත අභියාචනයක් කිරීමේ අයිතිය නියෝග අනුව නියම කරන පිළිවෙලක් අනුව දායකයෙකුට තිබිය යුතු අතර වාරික ගෙවීමට අපොහොසත් වීමේ හේතු දායකයාට පාලනය කළ නොහැකි වූ විට ඒ බවට අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වුවහොත් අධ්‍යක්ෂවරයා විසින් සහතිකය වලංගු කරනු ලැබිය යුතු ය.

(v) සහතිකයක් වලංගු කිරීමට අධ්‍යක්ෂවරයා තීරණය කරන අවස්ථාවක වාරික මුදල් ගෙවිය යුත්තේ යම් දිනකට පෙර ද ඒ දිනය දායකයා වෙත දැන්විය යුතු ය. එදිනට පෙර එකී දායක මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහුගේ සහතිකය අවලංගු වූවා සේ සැළකිය හැකිය.

දායක මුදල්.

15. නියෝග මගින් නියම කරනු ලබන නියමයන් අනුව මේ යෝජනා ක්‍රමයේ දායක මුදල් දායකයා හා අදාළ සමුපකාර සමිතිය හෝ සංගමය විසින් ගෙවිය යුතු ය. සමුපකාර සමිතියක හෝ සංගමයක සේවයේ නියුතු මෙම යෝජනා ක්‍රමයේ දායකයන් විසින් ගෙවනු ලබන දායක මුදල් සමිතිය හෝ සංගමය විසින් යෝජනා ක්‍රමය වෙත ප්‍රේෂණය කළ යුතු ය. එම නියෝග අනුව දායක මුදල් ගෙවනු ලැබිය යුත්තේ යම් දිනකට පෙර ද, ඒ දිනය නිශ්චිත වශයෙන් දක්වා තිබිය යුතු අතර සමුපකාර සමිතියක් හෝ සංගමයක් දායක මුදල් ගෙවීම එකී නිශ්චිත දිනට ගෙවීම නොකරන්නේ නම් නියෝග අනුව නියම කරන දඩ මුදලකට යටත් විය යුතු ය.

සමුපකාර සමිති හෝ සංගමය ඈවර කිරීම ඒකාබද්ධ කිරීම මත විශ්‍රාම වැටුප අහිමි නොවිය යුතු බව.

16. (i) යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් නීතිය අනුව ඈවර කිරීම සඳහා ලියාපදිංචිය අවලංගුකර ඇති විටෙක, සමිතිය හෝ සංගමය හෝ ලියාපදිංචිය අවලංගු කරන දිනය දක්වා දායකයා මුදල් ගෙවා ඇත්තේ නම් නියෝග අනුව නියම කරන ආකාරයට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු ය.

(ii) යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ සමඟ ඒකාබද්ධ වන්නේ නම් හා යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව යම් සමුපකාර සමිති හෝ සංගම්වලට විබද්ධ වන්නේ නම්, දායකයාට මෙම යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුපකට හිමිකම් අහිමිවීමක් සේ නොසැළකිය යුතු අතර, නව සේවා යෝජිත සමිතිය හෝ සංගමය හෝ මගින් යෝජනා ක්‍රමයේ දායකයා රැඳී සිටීයැයි සැළකිය යුතු ය.

ප්‍රදානය අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

17. නියෝග මගින් නියම කරනු ලබන නියමයන් අනුව යම් දායකයෙකුට යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ප්‍රදානය කිරීම අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

අභියාචනා බලය

18. (i) අධ්‍යක්ෂවරයාගේ තීරණය පිළිබඳව අතෘප්තියට පත් යම් දායකයකුට, සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් කළ හැක්කේ ය.

දින 30ක් ඇතුළත අභියාචනා කළ යුතු බව.

(ii) අධ්‍යක්ෂවරයාගේ තීරණයක් සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවූ යම් දායකයකුට අධ්‍යක්ෂවරයාගේ තීරණය ලැබී දින 30 ක් ඇතුළත දී තම අභියාචනයට හේතු සඳහන් කරමින් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් කරනු ලැබිය හැකිය.

දින 90ක් තුළ අභියාචනා තීරණය ලබාදිය යුතු බව.

(iii) අභියාචනා සම්බන්ධව සමුපකාර සේවක කොමිෂන් සභාවේ තීරණය දින 90ක් ඇතුළත අභියාචක වෙත දැන්විය යුතු ය.

(iv) එවැනි අභියාචනයක් පිළිබඳ සමුපකාර සේවක කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා බලාත්මක විය යුතු ය.

විශ්‍රාම වැටුප, දීමනාව, පාරිතෝෂිකය, පවරාදීම හෝ ඉන් අයකර ගැනීම හෝ නොකළ යුතු බව.

19. යෝජනා ක්‍රමයෙන් ගෙවනු ලැබිය හැකි කිසිම විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක්, පවරාදීම හෝ අන්සතු කිරීම හෝ නොකළ යුතු අතර, සෑම පවරා දීමක් හෝ අන්සතු කිරීමක් හෝ සම්පූර්ණයෙන්ම ශූන්‍ය, අවලංගු හා බල රහිත වන්නේ ය. මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග යටතේ හෝ අධ්‍යක්ෂවරයාට පැවරී ඇති බලතල යටතේ හැර වෙනත් පාර්ශවයකට විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ දීමනාව හෝ ගෙවනු ලැබිය යුතු තැනැත්තාගෙන් ලැබිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් හෝ සම්බන්ධයෙන් එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දීමනාවක් හෝ තහනම් කිරීමක් හෝ රිට් ආඥා ක්‍රියාත්මක කිරීමෙන් අයකර ගැනීමක් හෝ කරනු නොලැබිය යුතු ය.

### *3 වන කොටස*

### *සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල*

සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල.

20. (i) මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(ii) එම අරමුදල වෙත,

(අ) යෝජනා ක්‍රමය මෙහෙයවීම සඳහා දකුණු පළාතේ පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයන් ;

(ආ) මුදල් විෂයභාර පළාත් අමාත්‍යවරයා විසින් කලින් කල අධ්‍යක්ෂවරයා වෙත අත්තිකාරම් වශයෙන් දෙනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ;

(ඇ) සමුපකාර අරමුදලින් ප්‍රේෂණය කරනු ලබන්නා වූ මුදල් ;

(ඈ) යම් සමුපකාර සමිතියක් හෝ සංගමයකින් හෝ වාර්ෂිකව හෝ කලින් කල දෙනු ලබන මුදල් ප්‍රමාණයන් ;

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම පිණිස, කාර්යයන් ඉටුකිරීමේ දී සහ කර්තව්‍යන් කිරීමේ දී ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන් ;

(ඊ) ත්‍යාග සහ ප්‍රදාන මාර්ගයෙන් යම් සම්භවයකින් ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන් ;

(උ) යෝජනා ක්‍රමයේ දායකයන් විසින් දායක මුදල් වශයෙන් යෝජනා ක්‍රමය වෙත ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඌ) ආයෝජනවලින් පොලිය හෝ ලාභ හෝ වශයෙන් උපයාගන්නා ලද සියලු මුදල් ප්‍රමාණයන් ;

(එ) අරමුදල වෙත ත්‍යාග හා ප්‍රදාන වශයෙන් යම් සම්භවයකින් ලැබෙන සියලු මුදල් හා මෙම යෝජනා ක්‍රමයේ කර්තව්‍යයන් කිරීමේ දී අධ්‍යක්ෂවරයා වෙත සමුපකාර සමිතිවලින් හා සංගම්වලින් අත්තිකාරම් මාර්ගයෙන් දෙනු ලැබිය හැකි වූ මුදල් ප්‍රමාණයන් ප්‍රේෂණය කළ හැකිය.

(iii) මෙම අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.

(iv) මෙම ප්‍රඥප්තිය යටතේ උපදේශක කාරක සභාවේ හා අධ්‍යක්ෂකවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කාර්යයන් ඉටු කිරීමේ දී සහ කර්තව්‍යයන් කිරීමේ දී උපදේශක කාරක සභාව විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් හෝ දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු මුදල් ප්‍රමාණයන් ද මෙම ප්‍රඥප්තිය මගින් හෝ නියෝග යටතේ හෝ අරමුදලින් ගෙවිය යුතුවන මුදල් ප්‍රමාණයන් ද, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

21. මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාට වහාම අවශ්‍ය නොවන්නා වූ අරමුදලේ සියලු මුදල්, උපදේශක කාරක සභාවේ තීරණය අනුව අධ්‍යක්ෂවරයා විසින් රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය මූල්‍ය ආයතනයක හෝ ආයෝජනය කරනු ලැබිය යුතු ය. මුදල් ආයෝජනය කිරීම.

22. අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ තීරණය ඇතිව අධ්‍යක්ෂවරයාගේ බැඳීම් ඉටුකිරීම සඳහා නැතහොත් මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමය ක්‍රියාවේ යෙදවීම සඳහා අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වන්නා වූ මුදල්, සමුපකාර අරමුදලින් ණයට ගැනීම කළ හැකිය. මුදල් ණයට ගැනීමේ බලතල.

23. (i) යෝජනා ක්‍රමයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය.

(ii) පිළිගත් ගිණුම් මූලධර්ම, ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමට අධ්‍යක්ෂවරයා වග බලා ගත යුතු ය. අධ්‍යක්ෂවරයා විසින් එම කාර්යය දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයා ලවා ඉටුකරවා ගත යුත්තේ ය. ගිණුම් සැකසීම.

(iii) අධ්‍යක්ෂවරයා විසින් මෙම යෝජනා ක්‍රමයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික වියදම් ඇස්තමේන්තුවක් පිළියෙළ කර, උපදේශක කාරක සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය.

(iv) සෑම කාර්තුවක් අවසානයේ දී ත්‍රෛමාසික ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාව පිළියෙළ කළ යුතු අතර එම වාර්තාව කාර්තුව අවසාන වී දින 30 ක් ඇතුළත උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(v) අධ්‍යක්ෂවරයා විසින් එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට පැවති ආකාරයට යෝජනා ක්‍රමයේ පොත්පත් තුලනය කිරීමට සැලැස්විය යුතු අතර, එකී දිනයට ආදායම් හා වියදම් ගිණුමක් හා වත්කම්වල හා බැරකම්වල සාරාංශයක් අඩංගු ශේෂ පත්‍රයක් ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර උපදේශක කාරක සභාවට ඉදිරිපත් කළ යුතු ය. පළාත් සභාවට ගිණුම් ඉදිරිපත් කළ යුතු බව.

(vi) 23 (v) ඡේදයේ සඳහන් තොරතුරු එම වර්ෂයේ ජූනි මස 30 දිනට පෙර පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(vii) සෑම වර්ෂයකදීම යෝජනා ක්‍රමයේ ගිණුම් පළාත් සභාවේ විගණනය භාර නිලධාරියා විසින් හෝ නීතියට අනුකූලව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය. ගිණුම් විගණනය.

## 4 වන කොටස

## වෙනත් කරුණු

24. (i) ඇතැම් විට නියම කෙරෙතැයි හෝ නියම කළ යුතු යැයි මෙම ප්‍රඥප්තියේ සඳහන් කරුණු හා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග සෑදීම.

(අ) යෝජනා ක්‍රමය විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය;

(ආ) සමුපකාර සේවකයකු යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ලබන්නේ කවර සුදුසුකම්, කොන්දේසි සහ අවස්ථානුගත කරුණු ඇතිව සහ කවර සීමා කිරීම් යටතේ ද වග තීරණය කිරීම ;

(ඇ) දායකයන් විසින් හා දායකයන් වෙනුවෙන් සමුපකාර සමිති, සංගම් විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් ප්‍රමාණය තීරණය කිරීම ;

(ඈ) දායකයන් වෙත විශ්‍රාම වැටුප්, පාරිතෝෂිකය හෝ දීමනා ගෙවිය යුතු පදනම තීරණය කිරීම ;

(ඉ) දායක මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් කොන්දේසි තීරණය කිරීම.

(ඊ) උපදේශක කාරක සභාවේ කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය හා රීති සකස් කිරීම.

(උ) අභියාචනා ක්‍රියාවලිය පිළිබඳ කාර්ය පටිපාටි හා රීති සකස් කිරීම.

(ඌ) විශ්‍රාම වැටුප් හිමිකම් සහතිකය අවසන් කිරීම හෝ අහිමි කිරීම.

(එ) මරණ පාරිතෝෂිකය ගෙවීම් පදනම සහ ප්‍රමාණය තීරණය කිරීම.

(ඒ) අදාළ ආකෘති නියම කිරීම.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය. එසේ පළකරනු ලබන දිනයේ දී හෝ නියෝගවල සඳහන් පසු දිනයක දී එය ක්‍රියාත්මක විය යුතු ය.

(iii) එවැනි සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු ලැබූ යම් නියෝගයක් *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි ඒ අනුමත කරනු නොලැබූ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකණු ලබන දිනය *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබිය යුතු ය.

මෙම ප්‍රඥප්තිය යටතේ හෝ අධ්‍යක්ෂවරයාගේ නියෝග මත හෝ ගන්නා ලද පියවර සඳහා ආරක්ෂාව

25. (i) අධ්‍යක්ෂවරයා හෝ උපදේශක කාරක සභාව හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට හෝ උපදේශක කාරක සභාවට හෝ උපදේශක කාරක සභාවේ සාමාජිකයකුට හෝ සමුපකාර සේවක කොමිෂන් සභාවට හෝ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයකුට; හෝ,

(ii) අධ්‍යක්ෂවරයාගේ හෝ උපදේශක කාරක සභාවේ හෝ සමුපකාර සේවක කොමිෂන් සභාවේ හෝ විධානයක් මත සද්භාවයෙන් කරන ලද හෝ එසේ අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා හෝ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහායවන නිලධාරියකුට හෝ සේවකයකුට හෝ විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ පැවරීමට නොහැකි විය යුතු ය.

වැරදි හා දණ්ඩන

26. මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් හෝ කඩ කරන්නා වූ නැතහොත් ඒ අනුව කටයුතු කිරීම පැහැර හරින්නා වූ සෑම සමුපකාර සමිතියක් හෝ සංගමයක්ම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට මාස 06 ක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දොළොස් දහසක දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

අර්ථ නිරූපන

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ

''පළාත් සභාව'' යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

''අමාත්‍යවරයා'' යන්නෙන් තත්කාලයේ දකුණු පළාතේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වේ.

''සමුපකාර සේවක කොමිෂන් සභාව'' යන්නෙන් 1998 අංක 01 දරන දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ දකුණු පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව අදහස් වේ.

''සමුපකාර සමිතියක්'' යන්නෙන් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ දකුණු පළාතේ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක්/ සංගමයක් අදහස් වේ.

''සමුපකාර සංගමයක්'' යන්නෙන් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ දකුණු පළාතේ ලියාපදිංචි කළ සමුපකාර සමිති කීපයකින් සමන්විත ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් වේ.

''සේවකයා'' යන්නෙන් 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව හා අංක 1998 අංක 01 දරන දකුණු පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ අර්ථානුකූල සමුපකාර සමිතියක/සංගමයක ස්ථිර පත්වීමක් ලද සේවකයෙක්, සේවකයා යන්නෙන් අදහස් වේ.

''නීත්‍යානුකූල පරීක්ෂණයක්'' යන්නෙන් විධිමත් විනය පරීක්ෂණයක් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ විධිවිධාන අනුව සිදු කරන ලද පරීක්ෂණයක් අදහස් වේ.

අනනුකූලතාව බල පැවැත්වීම.

28. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

04-890

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.